OL/2025(2026)/63-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II**
முயற்சியாண்மைக் கற்கை I, II
Entrepreneurship Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

*උපදෙස්:*

- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ✻ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- ✻ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ව්‍යවසායකත්වය පිළිබඳ ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - මෙය මිනිස් චින්තනය හා බැඳුනු මනෝභාවයකි.
B - මෙය නව අදහස් හා සංකල්ප ක්‍රියාවට නගන ස්වභාවයකි.
C - මෙය සමාජයීය පරිවර්තන ක්‍රියාවලියකි.
D - මෙය සමාජ යහපත උදෙසා ක්‍රියාත්මකවීමේ ස්වභාවයකි.

මේවා අතුරෙන් ව්‍යවසායකත්වය නිවැරදි ලෙස විස්තර කෙරෙන ප්‍රකාශ වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B, C හා D පමණි. (4) A, B, C හා D යන සියල්ලම ය.

**2.** රන්මල් තම නිෂ්පාදිතය සඳහා ආකර්ෂණීය දැවටුමක් සකස් කිරීම සැලකිය හැක්කේ

(1) නිර්මාණශීලීත්වය ලෙස ය. (2) නවෝත්පාදනය ලෙස ය.
(3) අනාගත දැක්ම ලෙස ය. (4) පරිසරයට සංවේදීවීම ලෙස ය.

**3.** ව්‍යවසායකයකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි වන්නේ

(1) සේවකයින්ගේ හැකියා විශ්ලේෂණය කිරීම තුළින් ය.
(2) ව්‍යවසායකත්වය අධ්‍යයනය කිරීම තුළින් ය.
(3) සේවකයන්ගේ නිර්මාණශීලීත්වය සඳහා මූල්‍ය ත්‍යාග ලබා දීම තුළින් ය.
(4) ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයකට පැවරීම තුළින් ය.

**4.** ලොන්ඩ්‍රි ව්‍යාපාර සංකල්පය වෙළෙඳපොළට පිවිසීම සඳහා බලපෑම් කළ නවෝත්පාදන මූලාශ්‍රය වන්නේ

(1) ක්‍රියාවලි අවශ්‍යතාවයයි. (2) ප්‍රජා පරිසරය හා ජන ජීවිතයේ වෙනස්වීමයි.
(3) සංජානනය වෙනස්වීමයි. (4) වෙළෙඳපොළ වෙනස්වීමයි.

**5.** සෙව්වන්දි, බැංකු කටයුතු සිදුකිරීම පිණිස බැංකුවට යාම අනිවාර්ය වේ යැයි සිතා, තම අපේක්ෂිත ව්‍යාපාරය සඳහා බැංකු ගිණුමක් ආරම්භ නොකිරීමට තීරණය කරයි. මෙහි දී සෙව්වන්දිගේ චින්තනයට බාධාකාරී වූ සාධකය වන්නේ,

(1) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම ය. (2) වැරදි හා විවේචන සඳහා ඇති බිය ය.
(3) ප්‍රායෝගිකවීමට බාධා ඇතැයි සිතීම ය. (4) තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම ය.

**6.** නිපුනි අත්පිට මුදලට පමණක් තම අත්කම් භාණ්ඩ අලෙවි කළ ද විදේශීය සංචාරකයින් සඳහා ණයපත් භාවිතය මගින් තම භාණ්ඩ අලෙවි කිරීමට ඇය තීරණය කළාය. මේ තුළින් නිපුනි පෙන්නුම් කරන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ

(1) ස්වාධීනත්වයයි. (2) තොරතුරු සොයා බැලීමයි.
(3) අනාගත දැක්මයි. (4) නම්‍යශීලීත්වයයි.

**7.** නිෂ්පාදන සාධක අතුරෙන් වඩාත් ම සුවිශේෂී සාධකය වන්නේ

(1) භූමියයි. (2) ශ්‍රමයයි.
(3) ප්‍රාග්ධනයයි. (4) ව්‍යවසායකත්වයයි.

[ දෙවැනි පිටුව බලන්න.

**8.** රත්රස බිස්කට් ආයතනය විසින් සීනි රහිත බිස්කට් වර්ගයක් හඳුන්වාදීමට කටයුතු කිරීම සැලකිය හැක්කේ
(1) නව සොයාගැනීමක් ලෙස ය. (2) දිගුවක් ලෙස ය.
(3) අනුකරණයක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

**9.** අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා තම ව්‍යාපාරය නිවැරදි මාවතට යොමු කිරීමට තමාට හැකි බව සුනිමල් පවසයි. මෙයින් පිළිබිඹු වන ව්‍යවසායකත්ව ගතිලක්ෂණය වන්නේ
(1) නම්‍යශීලීත්වයයි. (2) නිර්මාණශීලීත්වයයි.
(3) අනාගත දැක්මයි. (4) ආත්ම විශ්වාසයයි.

**10.** සිරිමල්ගේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාගැනීමයි.
මෙම ප්‍රකාශයේ අන්තර්ගත අවශ්‍යතාව හා වුවමනාව පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) අධ්‍යාපනය හා ජාතික විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා ගැනීම
(2) විනෝදාස්වාදය හා ජාතික විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා ගැනීම
(3) ආරක්ෂාව හා ජාතික විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා ගැනීම
(4) ජාතික විශ්ව විද්‍යාලයකින් උපාධිය ලබා ගැනීම සහ අධ්‍යාපනය

**11.** ස්වකීය වගා කටයුතු සඳහා රසායනික පොහොර භාවිතයේ සිට කාබනික පොහොරවලට මාරුවීමෙන් ඉහළ ප්‍රතිලාභයක් අත්කර ගත් කුසල්,
(1) අභ්‍යන්තර ව්‍යවසායකයෙකි. (2) සමාජයීය ව්‍යවසායකයෙකි.
(3) ව්‍යාපාරික ව්‍යවසායකයෙකි. (4) ආයතනික ව්‍යවසායකයෙකි.

**12.** ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ
(1) නව භාණ්ඩ හා සේවා වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.
(2) රැකියා අවස්ථා ජනනය කිරීම ය.
(3) දේශීය සම්පත් උපයෝජනය කිරීම ය.
(4) ප්‍රායෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම ය.

**13.** ව්‍යවසායකයකු විසින් කළමනාකරුගේ භූමිකාව ඉටුකරමින් කරනු ලබන කාර්යයක් වන්නේ
(1) ව්‍යාපාර සැලසුම් සකස් කිරීම ය.
(2) ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් මිලදී ගැනීම ය.
(3) සේවකයින්ට අවශ්‍ය මග පෙන්වීම ය.
(4) ව්‍යාපාරයේ ලාභ හෝ පාඩු විඳ දරා ගැනීම ය.

**14.** නව ව්‍යවසායකයකු වෙළෙඳපොළට ප්‍රවේශවීමේ දී ඉතා ඉහළ අවදානමක් පවතින්නේ
(1) පවතින භාණ්ඩයක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේදී ය.
(2) පවතින භාණ්ඩයක් පවතින වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේදී ය.
(3) නව භාණ්ඩයක් පවතින වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේදී ය.
(4) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීමේදී ය.

**15.** විධිමත් පටිපාටියක් අනුගමනය කර වඩා හොඳ සේවකයන් ව්‍යාපාරයට බඳවාගැනීමේ හැකියාව ව්‍යවසායකයකුගේ
(1) මානව කුසලතාවයකි. (2) තාක්ෂණික කුසලතාවයකි.
(3) උපදේශන කුසලතාවයකි. (4) සංකල්පනාත්මක කුසලතාවයකි.

**16.** වර්තමානයේ පවතින ව්‍යාපාර පරිසරයට වඩා අතීත ව්‍යාපාර පරිසරයේ තිබූ ලක්ෂණය කුමක් ද?
(1) ලාභය ප්‍රධාන අරමුණ විය.
(2) පාරිභෝගිකයන් වඩාත් බලවත් විය.
(3) අවශ්‍යතාවයක් සපුරාගැනීම සඳහා භාණ්ඩ හා සේවා රාශියක් පැවතුණි.
(4) ජාත්‍යන්තර සබඳතා වැඩිවශයෙන් පැවතුණි.

**17.** චාමර භාණ්ඩ විකිණීමේ හා බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහුගේ ව්‍යාපාරයට ශක්තියක් වන්නේ
(1) කාර්යක්ෂම සේවකයින් දෙදෙනෙකු සිටීම ය.
(2) රජය විසින් අයකරන බදු අනුපාතිකය අඩු කිරීම ය.
(3) වෙළෙඳ භාණ්ඩ සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම ය.
(4) ව්‍යාපාර සඳහා දෙනු ලබන ණයපොලී අනුපාතිකය අඩු කිරීම ය.

**18.** වර්තමානයේ දී ව්‍යාපාර කටයුතු සඳහා ජංගම දුරකථන භාවිත කිරීම අයත් වනුයේ
(1) ආර්ථික පරිසරයට ය. (2) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරයට ය.
(3) ප්‍රජා පරිසරයට ය. (4) දේශපාලන හා නෛතික පරිසරයට ය.

[ තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**19.** ව්‍යාපාර කටයුතු කෙරෙහි ආර්ථික පරිසරය තුළින් ඇති කරනු ලබන බලපෑමක් වන්නේ
(1) ආනයන භාණ්ඩ සඳහා බදු අනුපාතය ඉහළ දැමීම ය.
(2) භාණ්ඩ නිසි ප්‍රමිතකරණ සහතික යටතේ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම ය.
(3) බැංකු පොලී අනුපාතිකය ඉහළ දැමීම ය.
(4) ආර්ථිකමය වාසි ගෙන දෙන අන්තර්ජාතික ගිවිසුම්වලට එළඹීම ය.

**20.** වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ තෘතීයික අංශය යටතේ පවතින ව්‍යාපාරයක් වන්නේ
(1) උළු කර්මාන්තශාලාවයි. (2) ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතියයි.
(3) සිල්ලර වෙළෙඳසැලයි. (4) විසිතුරු මසුන් ඇති කිරීමයි.

**21.** බොහෝ ව්‍යාපාර අදහස් හඳුනාගත හැකි වුවද ඒවා ව්‍යාපාර බවට පත් **නොවීමට** ප්‍රධාන හේතුවක් වන්නේ
(1) ව්‍යවසායකත්ව චින්තනයන් අඩුවීම ය.
(2) ව්‍යාපාර සඳහා සුදුසු ජාතික ප්‍රතිපත්ති නොපැවතීම ය.
(3) ප්‍රාග්ධනය සපයාගැනීමට අපහසු වීම ය.
(4) තරගකාරිත්වයට සාර්ථකව මුහුණදීමට ඇති නොහැකියාව ය.

**22.** මුහුණ සේදීම සඳහා දියර වර්ගයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර අදහස මතු වූයේ
(1) ජනමාධ්‍ය තුළින් ය. (2) වෙළෙඳපොළ ඉල්ලුම තුළින් ය.
(3) වෙළෙඳපොළ සමීක්ෂණ තුළින් ය. (4) පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින් ය.

**23.** පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොළකට හඳුන්වාදීමක් ලෙස සැලකිය හැකි ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,
(1) මුදල් ගනුදෙනු මත පමණක් රැඳුනු ග්‍රාමීය ගොවීන් සඳහා නව ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදයක් හඳුන්වාදීම ය.
(2) මාර්ගගතව වෛද්‍යවරු සම්බන්ධ කර ගත හැකිවීම ය.
(3) විදේශ රටවල ගැනුම්කරුවන් වෙත භාණ්ඩ බෙදා හැරීමේ සේවාවක් ආරම්භ කිරීම ය.
(4) කාන්තාවන් සඳහා නව මුහුණ සෝදන දියර වර්ගයක් හඳුන්වා දීම ය.

**24.** නදුන් තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කිරීමට අදහස් කරයි. මෙම ව්‍යාපාරයේ අයිතිකරුවන් ලෙස සිටිය හැකි උපරිම පුද්ගලයන් සංඛ්‍යාව
(1) 2 කි. (2) 10 කි. (3) 20 කි. (4) 50 කි.

**25.** සීමාසහිත පෞද්ගලික සමාගම් පිළිබඳ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) එක් පුද්ගලයකුට වුව ද ආරම්භ කළ හැකි ය.
(2) සමාගමේ කොටස් මිල දී ගැනීමට මහජනයාට ආරාධනා කළ හැකි ය.
(3) කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සිදුකළ යුතු ය.
(4) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වේ.

**26.** ව්‍යාපාර සංවිධාන, පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස වර්ග කරනු ලබන්නේ
(1) ව්‍යාපාරයේ අරමුණ අනුව ය. (2) ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ වගකීම අනුව ය.
(3) ව්‍යාපාරයේ හිමිකාරිත්වය අනුව ය. (4) ව්‍යාපාරය සපයන භාණ්ඩ හා සේවා අනුව ය.

**27.** කේවල ස්වාමි ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන්නේ
(1) ප්‍රාදේශීය ලේකම් විසින් ය. (2) දිස්ත්‍රික් ලේකම් විසින් ය.
(3) පළාත් ප්‍රධාන ලේකම් විසින් ය. (4) වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් ය.

**28.** ව්‍යවසායකයකු විසින් ඉටුකරනු ලබන පරාර්ථකාමී වගකීමක් වන්නේ
(1) සීමිත සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම ය.
(2) කුඩා පාසලකට ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීම ය.
(3) සේවක අර්ථසාධක අරමුදල් නිසි පරිදි ගෙවීම ය.
(4) ව්‍යාපාරය මගින් සපයනු ලබන සේවාවේ ගුණාත්මකභාවය වැඩි කිරීම ය.

**29.** ව්‍යවසායකයකුවීමට කාන්තාවන් තුළ ඇති ශක්තියක් ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) ස්වාධීනවීම (2) අත්දැකීම් බහුලවීම
(3) පිරිමැසුම් සහිතවීම (4) අවදානම් භාර ගැනීමට බිය නොවීම

**30.** ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කළ යුතු වන්නේ
(1) එමගින් ලාභය උපරිම කර ගැනීමට හැකි වන නිසා ය.
(2) අයිතිකරුවන් හා සේවකයන් අතර ආරවුල් වැළැක්විය හැකි නිසා ය.
(3) ස්වාභාවික පරිසරයට හානියක් නොමැතිව ව්‍යාපාරය කළ හැකි නිසා ය.
(4) එය රජය විසින් සියලු ව්‍යාපාර සඳහා පනවා ඇති නීතියක් නිසා ය.

31. අපනයනය සඳහා නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් දෙනු ලබන්නේ
(1) කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ය.
(2) කාර්මික තාක්ෂණ ආයතනය විසින් ය.
(3) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ය.
(4) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ය.

32. ව්‍යවසායකත්ව සංස්කෘතියක් තුළ වෙසෙන පුද්ගලයකු තුළින් දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වන්නේ
(1) වර්තමානයේ පවතින දෙයින් තෘප්තිමත්වීම ය. (2) සැමවිට ම සුබවාදීව සිතීම ය.
(3) පරිසරයට සංවේදී නොවීම ය. (4) පවතින දේ වෙනස්කිරීමට උත්සහ නොකිරීම ය.

33. කියවන්නාගේ සිතෙහි සමස්ත ව්‍යාපාරය පිළිබඳ චිත්‍රයක් නිර්මාණය වන ආකාරයෙන් සකස් කළ යුත්තේ ව්‍යාපාර සැලැස්මේ කුමන මූලිකාංගය ද?
(1) විධායක සාරාංශය (2) මූල්‍ය සැලැස්ම
(3) නිෂ්පාදන සැලැස්ම (4) පරිපාලන සැලැස්ම

34. යෝජිත ව්‍යාපාරයක අලෙවි සැලැස්මෙහි ඇතුළත් අයිතමයක් වන්නේ
(1) තනතුරු හා වගකීම් දැක්වෙන සංවිධාන සටහනයි.
(2) තරගකරුවන්ගේ සැපයුම් විශ්ලේෂණයයි.
(3) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයයි.
(4) අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනයයි.

35. ව්‍යවසායකයෙක් අලෙවි මිශ්‍රය ආශ්‍රිතව අලෙවි උපාය මාර්ග තේරීමේ දී එහි 'නිෂ්පාදනය' යන විචල්‍යය යටතේ සිදු කෙරෙන කාර්යයක් වන්නේ
(1) නිෂ්පාදිතය සඳහා නමක් සකස් කරන ආකාරය පිළිබඳ සලකා බැලීම ය.
(2) නිෂ්පාදිතයට මිල කිරීම කරන ආකාරය සලකා බැලීම ය.
(3) නිෂ්පාදිතය විකුණන ආකාරය පිළිබඳ සලකා බැලීම ය.
(4) නිෂ්පාදිතය සඳහා පාරිභෝගික ආකර්ෂණය ලබා ගන්නා ආකාරය පිළිබඳ සලකා බැලීම ය.

36. යෝජිත නිෂ්පාදන ව්‍යාපාරයක පරිපාලන සැලැස්මෙහි ඇතුළත් පරිපාලන වියදමක් වන්නේ
(1) කම්හල් සේවක වැටුප් ය. (2) බෙදා හැරීමේ රථ කුලී ය.
(3) ලිපිද්‍රව්‍ය සඳහා වියදම් ය. (4) ව්‍යාපාරය ආරම්භක දින උත්සව වියදම් ය.

37. ව්‍යාපාරයක් විසින් බැංකු ණය සඳහා ගෙවන පොලිය සැලකෙන්නේ
(1) පරිපාලන වියදමක් ලෙස ය.
(2) මූල්‍ය වියදමක් ලෙස ය.
(3) ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදමක් ලෙස ය.
(4) අලෙවි වියදමක් ලෙස ය.

38. ව්‍යාපාරයක මූල්‍ය සැලැස්මෙහි ඇතුළත්, ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර වියදමක් වන්නේ ව්‍යාපාරය සඳහා
(1) ගොඩනැගිල්ලක් මිල දී ගැනීම ය. (2) යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම ය.
(3) අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම ය. (4) සේවකයන් දෙදෙනෙකු බඳවා ගැනීම ය.

39. යෝජිත නිෂ්පාදන ව්‍යාපාරයක නිෂ්පාදන සැලැස්මෙහි ඇතුළත් ස්ථාවර වත්කමක් වන්නේ
(1) කාර්යාලයීය ලී බඩු ය. (2) බෙදාහැරීමේ රථ ය.
(3) වෙළෙඳසැල් ගොඩනැගිලි ය. (4) කම්හල් යන්ත්‍ර හා උපකරණ ය.

40. නව සබන් වර්ගයක් නිපදවීමට අපේක්ෂා කරන හර්ෂ විසින් සකස් කළ ඇස්තමේන්තුගත වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය පිරිවැය | 50 000 |
| ශ්‍රම පිරිවැය | 30 000 |
| වෙනත් නිෂ්පාදන වියදම් | 10 000 |
| පරිපාලන වියදම් | 20 000 |
| අලෙවි හා බෙදාහැරීමේ වියදම් | 10 000 |

හර්ෂගේ යෝජිත නව නිෂ්පාදිතයේ මුළු නිෂ්පාදන පිරිවැය
(1) රු. 80 000 කි. (2) රු. 90 000 කි. (3) රු. 110 000 කි. (4) රු. 120 000 කි.

* *

[ පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | |
|---|---|
| **ව්‍යවසායකත්ව අධ්‍යයනය** | **I, II** |
| முயற்சியாண்மைக் கற்கை | **I, II** |
| Entrepreneurship Studies | **I, II** |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

✻ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුරයේ ඓතිහාසික ස්ථානවලට නුදුරු ගමක ජීවත්වන නුවන් පෞද්ගලික ආයතනයක කළමනාකරණ සහකරුවෙකු ලෙස සේවය කරමින් සිටියි. තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කර, එය ජාත්‍යන්තර මට්ටමට දියුණු කරන බව ඔහු නිතර ම පවසයි. බොහෝ විදේශික සංචාරකයන් ශ්‍රී ලංකාවේ ගමක දින කිහිපයක් නැවතී ගැමි ජීවිතය රසවිඳීමට කැමති බව විදේශ සංචාරකයන්ට මග පෙන්වන්නෙකු ලෙස සේවය කරන නුවන්ගේ මිතුරෙකු වන දනුක ඔහුට පවසා ඇත. වැවක් හා කුඹුරු යායක් අද්දර පිහිටි තමාගේ ම ඉඩමක විදේශ සංචාරකයන් සඳහා 'විලේජ් ලයිෆ්' නමින් සංචාරක නිකේතනයක් තම මිතුරු දනුකගේ ද සහාය ඇති ව ආරම්භ කිරීමට නුවන් තීරණය කළේ ය. මෙම ඉඩම රු. 9 000 000 කට තක්සේරු කර ඇත.

- නුවන් හා දනුක ඔවුන්ගේ ව්‍යාපාරය සඳහා පහත සඳහන් දෑ සිදු කිරීමට එකඟ විය.

✻ නුවන්ගේ ඉඩමට අමතරව නුවන් සහ දනුක පිළිවෙළින් රු. 1 500 000 ක් රු. 3 500 000 ක් ව්‍යාපාරයට යෙදවිය යුතු ය.

✻ මැටි, ලී දඬු, පොල් අතු වැනි දේශීය ද්‍රව්‍ය භාවිත කර පැරණි ගැමි නිවෙස්වල තිබූ ලක්ෂණ සහිත කුඩා නිවාස හතරක් ඉදිකිරීම

✻ කිසිදු පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් නොමැති ගැමි තරුණයින් හතර දෙනෙකු ව්‍යාපාරයට බඳවා ගැනීම

✻ ඔවුන්ගේ ව්‍යාපාරය සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම හා නිකේතනයට පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය ආහාර, සෞඛ්‍ය හා ප්‍රවාහන පහසුකම් සැපයීම

(i) නුවන් තුළින් දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **හතරක්** ලියන්න.

(ii) (අ) නුවන්ට මෙම ව්‍යාපාර අදහස ඇතිවීමට හේතු වූයේ කුමක් ද?

(ආ) මෙම යෝජිත ව්‍යාපාරයේ ඉලක්කගත පාරිභෝගිකයන් කවුද?

(iii) නුවන්ට හා දනුකට ඔවුන්ගේ යෝජිත ව්‍යාපාරය ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග **දෙකක්** ලියන්න.

(iv) නුවන්ගේ හා දනුකගේ යෝජිත ව්‍යාපාරයේ ශක්තියක් හා දුර්වලතාවක් ලියන්න.

(v) නුවන් හා දනුක ව්‍යවසායකයන් ලෙස අයිතිකරුගේ භූමිකාව ඉටුකරන ආකාරය පෙන්වන නිදසුන් **දෙකක්** සිද්ධිය ඇසුරෙන් සඳහන් කරන්න.

- නුවන්ගේ හා දනුකගේ යෝජිත ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මෙන් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| ව්‍යාපාරය ලියාපදිංචි කිරීම | 12 000 |
| ඉඩමට විදුලිය හා ජලය ලබා ගැනීම | 68 000 |
| කුඩා නිවාස ඉදිකිරීම | 1 200 000 |
| ලී බඩු හා උපකරණ | 800 000 |
| ව්‍යාපාරය ආරම්භක දින උත්සව වියදම් | 20 000 |
| සේවක වැටුප් | 200 000 |
| දෛනික ව්‍යාපාර කටයුතු සඳහා | 1 600 000 |
| ප්‍රචාරණ හා ප්‍රවාහන ගාස්තු සඳහා | 400 000 |
| අපේක්ෂිත මාසික ආදායම | 3 400 000 |

**අවශ්‍ය වන්නේ:** නුවන්ගේ හා දනුකගේ යෝජිත ව්‍යාපාරයේ පහත සඳහන් දෑ දැක්වීම

(vi) මුළු ආයෝජනය

(vii) මුළු ස්ථාවර වත්කම්

(viii) ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම්

(ix) මුළු ඇස්තමේන්තුගත මුදල් ගලා ඒම්

(x) පළමු මාසයට අදාළ (අ) මුළු වියදම

(ආ) ශුද්ධ ලාභය

(ලකුණු 02 × 10 = 20 යි)

2. (i) පුද්ගලයකුට රැකියාවක නියුතුවීමට වඩා ව්‍යවසායකයකුවීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(ii) ව්‍යවසායකයකු හා ව්‍යාපාරිකයකු අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පුද්ගලයකුගේ ඇස හා මොළය ව්‍යවසායකයකු බවට පත්වීම සඳහා උපකාර වන ආකාරය කෙටියෙන් දක්වන්න.

(iv) ඕනෑම ගැටලුවකට නිර්මාණශීලීව විසඳුම් සෙවීමේ දී මතු වන බාධා **හතරක්** ලියන්න.

(v) 'ව්‍යවසායකයන් රටකට වත්කමකි.' මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

3. (i) නිෂ්පාදන සාධකයක් වන 'ප්‍රාග්ධනය' යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කර, ඒ සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.

(ii) කුඩා පරිමාණ ව්‍යාපාර රටක ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර **දෙකක්** ලියන්න.

(iii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරයට ශක්තියක් වන ආකාරය වෙන වෙන ම ලියන්න.

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ව්‍යාපාර අංශ වන ප්‍රාථමික හා ද්විතීයික අංශවලට අයත් ව්‍යාපාර සඳහා උදාහරණ **දෙක** බැගින් සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයකුගේ සංකල්පනාත්මක කුසලතාව පෙන්නුම් කෙරෙන අවස්ථා **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

4. (i) ස්වාභාවික පරිසරයෙන් ලබා ගත හැකි මානව නොවන සම්පත් **දෙකක්** නම් කර, ඒවා තුළින් නිර්මාණය කර ගත හැකි ව්‍යාපාර අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ii) පහත සඳහන් එක් එක් ව්‍යාපාර කටයුත්ත සඳහා සුදුසු ස්ථානය බැගින් ලියන්න.

(අ) උත්සව ශාලාවක් ආරම්භ කිරීම

(ආ) පොත් වෙළෙඳසැලක් ඇරඹීම

(iii) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම තුළින් වෙළෙඳපොළට ප්‍රවේශවීමෙන් ව්‍යවසායකයකුට ලැබෙන වාසියක් හා අවාසියක් ලියන්න.

(iv) වර්තමානයේ පවතින ව්‍යාපාර බිහිවීම සඳහා ව්‍යාපාර අදහස් විවිධාකාරයෙන් මතු වී ඇත. එවැනි ව්‍යාපාර අදහස් මතුවන මූලාශ්‍ර **හතරක්** ලියන්න.

(v) (අ) 'පේටන්ට් බලපත්‍රය' යනු කුමක් ද?

(ආ) පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

5. (i) ඕනෑම ව්‍යාපාර සංවිධානයක දක්නට ලැබෙන පොදු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ii) ව්‍යාපාර සංවිධාන, හිමිකාරිත්වය අනුව වර්ග කර, ඒවා එකිනෙකට නිදසුන බැගින් දක්වන්න.

(iii) බොහෝ ව්‍යවසායකයින් ඔවුන්ගේ ව්‍යාපාර කේවල ස්වාමි හෝ හවුල් ව්‍යාපාරයක් ලෙස ආරම්භ කරනවාට වඩා සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ආරම්භ කිරීමට කැමැත්තක් දැක්වීමට හේතු **දෙකක්** ලියන්න.

(iv) කේවල ස්වාමි ව්‍යාපාරයකට වඩා හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යාමෙන් ව්‍යවසායකයකුට මුහුණ පෑමට සිදුවන ගැටලු **දෙකක්** ලියන්න.

(v) වරලත් ව්‍යාපාරවල වරලත් ගිවිසුමකට ඇතුළත් කරනු ලබන පොදු එකඟතා **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



6. (i) 'ව්‍යවසායකත්ව සංස්කෘතියක්' යනු කුමක් ද?

(ii) ව්‍යවසායකත්ව සංස්කෘතියක් තුළින් රටක පවතින ආර්ථික හා සමාජයීය ගැටලු විසඳා ගත හැකි ආකාර **දෙකක්** ලියන්න.

(iii) කාන්තාවන්ට ව්‍යාපාර කිරීම සඳහා ඇතුළුවීමට ව්‍යාපාර පරිසරය තුළ ඉඩ ප්‍රස්ථා තිබීම වැදගත් වේ. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දැකිය හැකි එවැනි අවස්ථා **දෙකක්** ලියන්න.

(iv) රටක ව්‍යාපාර සඳහා ආචාරධර්ම අවශ්‍යවීමට හේතු **දෙකක්** උදාහරණ සහිතව සඳහන් කරන්න.

(v) ව්‍යාපාර, නීතිමය වගකීම් ඉටු නොකිරීම නිසා රටකට මුහුණදීමට සිදුවන ගැටලු **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 5 = 10 යි)

7. නිකිල්ගේ යෝජිත ව්‍යාපාරය සඳහා පිළියෙල කරනු ලැබූ ව්‍යාපාර සැලැස්මෙන් ලබාගත් තොරතුරු පහත දැක්වේ.

* නිකිල්ගේ රු. 1 500 000 ක ගොඩනැගිල්ල, ව්‍යාපාරය සඳහා භාවිත කිරීම
* රු. 500 000 ක බැංකු ණයක් ලබාගෙන මෙම මුදල් භාවිත කර රු. 500 000 ක ලී බඩු හා උපකරණ මිලදී ගැනීම
* පහත සඳහන් වියදම් නිකිල් සතු මුදලින් ගෙවීම
  - ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීම සඳහා රු. 20 000
  - ව්‍යාපාරය ආරම්භක දින උත්සව වියදම රු. 15 000
  - දෛනික ව්‍යාපාර කටයුතු සඳහා රු. 365 000

**අවශ්‍ය වන්නේ:**

මුළු ස්ථාවර වත්කම්, ආරම්භ කිරීමට පෙර වියදම්, මුළු කාරක ප්‍රාග්ධනය හා මුළු ආයෝජනය දැක්වෙන පරිදි නිකිල්ගේ යෝජිත ව්‍යාපාරයේ මුළු ආයෝජන ඇස්තමේන්තුව පිළියෙළ කිරීම

(පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න.)

| විස්තරය | යෝජිත ආයෝජනය | | මුළු ආයෝජනය (රු.) |
|---|---|---|---|
| | අයිතිකරු (රු.) | බැංකු ණය (රු.) | |
| | | | |


(මුළු ලකුණු 10 යි)

***


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350




Rs : 300




Rs : 300




Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200




Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

**මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.**

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE